


## මගේ දිනපොත

**ජූලි 3 බදාදා**
අද මම 8.30 ට අවදි උණා. අක්කා උදේ කෑමට පෑන් කේක් හැදුවා. මම අද පාසල් වැඩ කළා. අද මමයි මල්ලියි එළියට ගියා සෙල්ලම් කරන්න. අද හොඳට ඉර පායලා තිබුණා. අක්කා අපිට ළමා චිත්‍රපටියක් දාලා දුන්නා. මම අදනි දාගත්තේ ගොඩාක් සතුටින්. මමයි අක්කයි හෙට නැටුම් පුරුදුවෙන්න ශාලාවකට යනවා.

**ජූලි 4 බ්‍රහස්පතින්දා**
අද මම උදේම අවදි වුණා. මට ගොඩක් සතුටුයි. අද මම සිංහල පාසලේ තියෙන කොන්සට් එකට පුරුදු වෙන්න ගියා. මාව තෝර ගත්තෙ සුරංගනාවියක් වගේ නටන්න. මට නටන්න පොඩ්ඩක් අමාරුවුණා. හැබයි අක්කා ආවා නිසා ගෙදර ගිහිල්ලා මට අක්කා නැටුම පුරුදුකලා. ගෙදර ඇවිල්ලා දවල් කෑම කාලා රූපවාහිනිය බැලුවා.

කවීශා දංවත්ත
7/8 ශ්‍රේණිය සිංහල භාෂා පාසල රොක්ස්බර්ග් පාක්



**සෙනුල්‍යා රුවන් පතිරණ**
වයස අවු 4 එපින් වික්ටෝරියා

## අපේ රන්තරු ප්‍රසංගය

2013 සැප්තම්බර් 8 වැනි ඉරිදා අපේ රන්තරු ප්‍රසංගය පැවැත් වුණා. මේ ප්‍රසංගය තිබුනේ සවුත් මොරැන්ග් ප්ලෙන්ටි රේන්ජර්ස් ආර්ට්ස් ඇන්ඩ් කොන්වෙන්ෂන් මධ්‍යස්ථානයේදීය. මෙම පසංගයට සහභාගී වුනේ එපික් හා රොක්ස්බර්ග් පාර්ක් සිංහල භාෂා පාසලේ 1 -12 ශ්‍රේණිවල සිසුන්. මම සිටියේ " රිදුනු ගුරු සිත" අංගයේ. කෝරස් ගායිකාවක් විදියට. මෙම අංගය 1 -12 වන ශ්‍රේණියේ ළමුන් සහභාගී වුනා. මම ඊට පසු ශ්‍රී ලංකාවේ සහ ඕස්ට්‍රේලියාවේ ජාතික ගීය ගයන්න සිටියා. අපේ දෙමාපියන් බොහෝ විදියට උදව් කලා. අපේ ප්‍රසංගයට ආරාධිතයෝ රැසක් පැමිණියා. අපේ අංගය ඇරෙන්න තවත් ලස්සන නැටුම්, ගැයුම් තිබුණා. මෙම ප්‍රසංගය සාර්ථක වුනේ දෙමාපියන්, ගුරුවරුන් සහ සිසු දරුවන්ගේ සහභාගීත්වයෙන්.

චතුනි පෙරේරා
7/8 ශ්‍රේණිය සිංහල භාෂා පාසල රොක්ස්බර්ග් පාක්

## මගේ දිනපොත

අද මම මගේ පවුලේ අය එක්ක හිම බලන්න ගියා. අපි උදේම නැගිටලා, ලෑස්තිවෙලා; 'ඩිනර් ප්ලේන්' කියන පළාතට පිටත්වුණා. ඒ ගමනට පැය පහක් පමණ ගත වුණා. හවස් වෙනකොට අපි එතැනට ළගාවුණා.

'ඩිනර් ප්ලේන්' හරි ලස්සනයි. හැමතැනම හිම වැටිලා මුළු පළාතම සුදු රෙද්දකින් වැහිලා වගේ.

අපි සීතලට රස්නේ ඇඳුම් ඇඳගෙන එළියට බැස්සා. මමයි නංගියි අඳුරු වෙනකල්ම සෙල්ලම් කළා. සෙල්ලම් කරලා ඉවරවෙලා අපේ ඇඟිලි සීතලට රතු වෙලා, ගැහෙනවා. රෑ කෑම කන්න අපි ලස්සන හෝටලයකට ගියා.

අද උදේ අපි හිම කඩා වැටෙන ශබ්දය ඇසී නැගටුණා. එළියේ තවත් හිම වැටිලා ගස් වල අතු සැරසිලා, සුදු ගවුමක් ඇඳලා වගේ.

මමයි මගේ නංගියි නැවත හිමේ සෙල්ලම් කරන්න ගියා. අපි හිම බබෙක් හැදුවා. අත් හදන්න කෝටු ගත්තා. ඇස්, කට හා නහයකුත් හැදුවා.

අපි හිම බබා හදලා ඉවර කරලා උස් කන්දකට ගියා. මමයි මගේ නංගියි හිම ක්‍රීඩා වලට යන්න ලෑස්ති වුණා. ඒ කට පැය තුනක් ගියා.

ආයෙම 'ඩිනර් ප්ලේන්' ගිහිල්ලා අපි තව ටිකක් සෙල්ලම් කරලා කාලා අපේ නවාතැනට ගියා. එහේදී අපි රෑ වෙනකල් හිටියා. තාත්තයි අම්මයි සිංදු කිව්වා. මම පොතක් කියෙව්වා. නංගි සෙල්ලම් කළා.

හෙට අපි ගෙදර යනවා.

දෙව්මි අබේසිරිගුණවර්ධන
7/8 ශ්‍රේණිය සිංහල භාෂා පාසල
රොක්ස්බර්ග් පාක්

## අපේ විවිධ ප්‍රසංගය

අපේ රොක්ස්බර්ග් පාක් සිංහල පාසලේ විවිධ ප්‍රසංගය 2013 සැප්තැම්බර් 8 වෙනි ඉරිදා සවුත් මොරැන්ග් ප්ලෙන්ටි රේන්ජර්ස් ආර්ට්ස් ඇන්ඩ් කොන්වෙන්ෂන් මධ්‍යස්ථානයේදී පැවැත් වුණා. මේ ප්‍රසංගයේ ගොඩාක් ලස්සන අංග තිබුනා. මම හිටියේ රිදුනු ගුරු සිත නාට්‍යයටයි. මම හිටියේ රජතුමාගේ සේවිකාවක් ලෙසටයි. තව පෙරහැරකටත් හිටියා. එහිදී අපේ අංගය යන ගමන් මම හෙව්වේ නරඹන්නන් අතර අම්මයි තාත්තයි කෝ කියලයි. එයාලව දැක්කහම මට ලොකු සතුටක් ඇති වුනා. අපේ ප්‍රසංගය බලන්න අම්මාගේ යහලුවෙක් ලංකාවෙන් ඇවිත් හිටියා. ඇය ගුරුවරියක්. එයා අපේ ප්‍රසංගය හුගාක් අගය කලා. ප්‍රසංගය නිමවී අපි සැවොම ඉතා සතුටින් තම තමන්ගේ නිවෙස් බලා පිටත් වුණා.

ප්‍රසාදි ලියනගේ
7/8 ශ්‍රේණිය
රොක්ස්බර්ග් පාක් සිංහල භාෂා පාසල

## Butterfly Wings

I long for wings like the butterfly's,
To lift me in the air,
So I can climb across the skies
And travel anywhere.

I'd see the world from up above,
And dart across the seas,
I'd glide upon the gentle wind,
And tussle with the breeze.

I'd see the sunset fiercely glow,
And feel its cheering warmth,
I'd drift to sleep beneath the stars,
And call the woodlands “home”.

I'd fly through glistening raindrops,
And hear their voices sing,
As the joyful birds chirp and trill
And whistle of the spring.

A little nest would make my bed;
I'd assemble it with care,
And make my homely crib the best
Of all the places there'
I long for wings like the butterfly's
To show me all the world,
So I can taste of freedom,
And wander undeterred.

Dewmini
Abeysirigunawardane
Year 8
Penleigh and Essendon Grammar School

## මගේ තාත්තා

මගේ තාත්තාගේ නම මයිකල් රනසිංහ. මගේ තාත්තා මටයි මල්ලිටයි හරි ආදරෙයි. එයා අපිට ඕනෑ කරන දේවල් අරන් දෙනවා. මගේ තාත්තා රැකියාව කරන්නේ කැරවෑන් හදන තැනක. තාත්තා අපට හොඳ නරක කියලා දෙනවා. තාත්තා අපේ පාසැල් වැඩ වලටත් උදව් වෙනවා.

තාත්තා අපිට වගේම අම්මාට චූටි මල්ලිට හරි ආදරෙයි. අපිත් තාත්තාට ගොඩක් ආදරෙයි.

කිසල් රණසිංහ
7/8 ශ්‍රේණිය සිංහල භාෂා පාසල

## අපේ බල්ලා

මට ඉන්නවා චූටි බලු පැටියෙක් ජැකි කියලා. ඌට දැන් වයස අවුරුදු 6 ක්. ඌට සුදු බුල් තියනවා. හැබැයි ඌගෙ කන් දෙකේ කළුයි දුඹුරුයි තියෙනවා. අපේ ජැකිව ගත්තේ මට අවුරුදු 5 ක් වෙනකොට. ජැකිට අපි 'යං' කියන වචනේ ඇහුනොත් ඌ හිතන්නේ එයාව ඇවිදින්න අරගෙන යනවා කියලායි.

අපේ බල්ලා ඉන්නෙ පවුලේ සාමාජිකයෙක් වගේ. ජැකි හුගාක් වේලාවට හොඳයි. හැබැයි ඌ සමහර වෙලාවට වත්තේ තියෙන තාත්තාගේ මිරිස් පැල අදිනවා. අපේ බල්ලා කුරුල්ලන්ට හරි අකමැතියි. අපි කුරුල්ලන්ට කෑම දැම්මාම ජැකි උන්ට ඒවා කන්න දෙන්නේ නැහැ. ජැකි හිතන්නේ කුරුල්ලන්ට එයාට වඩා හොඳ කෑම හම්බ වෙනවා කියලයි. මට මතකයි ජැකිව ගෙනාපු පළවෙනි සතිය. අපි ජැකිට කිරි බොන්න දුන්නේ චූටි පීරිසියකට දාලා. එදාට පස්සේ ඌ හැමදාම උදේට කිරි බොනවා. අපේ බල්ලා හරි සුරතල්. මම ජැකිට ගොඩක් ආදරෙයි.

ප්‍රසාදි ලියනගේ
7/8 ශ්‍රේණිය සිංහල භාෂා පාසල රොක්ස්බර්ග්පාක්

## තාක්ෂණය කොයිබටද?

## අපේ නාට්‍යය

රන්තරු 2013 විවිධ ප්‍රසංගයේ අපේ නාට්‍යය වූයේ තාක්ෂණය කොයිබටද? නාට්‍යයයි. එහි රඟපෑම අපට ඉතා හොඳ අත්දැකීමක් වුනා. වේදිකාවක රඟපාන ආකාරය අපි ඉගෙන ගත්තා. තාක්ෂණය හොඳ ආකායට යොදා ගන්නා හැටි අපි තේරුම් ගත්තා.

අපේ නාට්‍යයේ මගේ චරිතය වූයේ පාසලක ශිෂ්‍යයෙකුගේ චරිතයක්. එය හොඳින් රඟපෑමට අපේ ගුරුතුමිය හොඳින් පුහුණු කළා.

නාට්‍යයේ ගුරුතුමිය අසන ප්‍රශ්න වලට පිළිතුරු දීම මම හොඳින් කළා. "පළමුව හඳ මත පා තැබූ මිනිසා කවුද?" ගුරුතුමිය ඇසුවා. "නීල් ආම්ස්ට්‍රොන්ග්" යැයි මම පිළිතුරු දුන්නා.

දනුෂ් දන්දෙණිආරච්චිගේ
5/6 පන්තිය සිංහල භාෂා පාසල
රොක්ස්බර්ග් පාක්



Dexter Ranasinghe 13yrs Epping Victoria

## අපේ විවිධ ප්‍රසංගය

අපේ විවිධ ප්‍රසංගය හොඳින් කෙරුණා. අපේ ගුරුවරුන් කැපවෙලා විවිධ ප්‍රසංගය ඉතා ලස්සනට සංවිධානය කලා. දෙමව්පියෝ අපට උදව් කලා. මෙම විවිධ ප්‍රසංගයට ළමයි සැම දෙනාටම සහභාගීවීමට අවස්ථාව ලැබුණා. එය ඉතා හොඳ දෙයක්. මම මහදැනමුත්තාගේ නාට්‍යයට හරි ආසයි. විවිධ ප්‍රසංගය පුරා ලස්සන සින්දු, කතා, නැටුම් තිබුනා. ඒවා මම රස වින්දා. අපේ නාට්‍යයටත් මම හරි කැමතියි. මගේ චරිතය ආසාවෙන් රගපෑවෙමි. අපි හැමෝම කැපවෙලා වැඩ කළා. අපේ නාට්‍යයට හසිනි අක්කා සහ නෙවින් අයියා අපිට ගොඩක් උදව් කලා. අපේ නාට්‍යයට මහේෂා ගුරුතුමිය සහ ලෙස්ලි ගුරුතුමාත් අපට හොඳට නාට්‍යය කරගෙන යන්නට මග පෙන්වූවා. මගේ පැතුම මෙවැණි විවිධ ප්‍රසංග ඉදිරියේදිත් ඇති වේවා කියලයි. !

මළවරආරච්චිගේ යෝමිත් චේතින් කරුණාරත්න
සිංහල භාෂා පාසල - රොක්ස්බර්ග් පාක් 5/6 පන්තිය

## අපේ විවිධ ප්‍රසංගය

සැප්තැම්බර් 8 වෙනිදා අපේ රොක්ස්බර්ග් පාක් භාෂා පාසලේ විවිධ ප්‍රසංගය පැවැත්වුණා. අපේ විවිධ ප්‍රසංගයේ නම රන් තරු 2013. අපේ ප්‍රසංගයට පෙර අපි හැමදාම පුහුණු වූණා. අපේ නාට්‍යයට මහේෂා ගුරුතුමියද ලෙස්ලි ගුරුතුමාද සහ අපේ ආදරණීය අම්මලා තාත්තලාද හුගක් උදව් කළා.

අපේ ප්‍රසංගය හොඳින් පැවැත්වුණා. අපේ අයියලා, අක්කලාද, නංගිලා සහ මල්ලිලා එකමුතුව වැඩ කල නිසා එය ඉතා හොඳින් පවත්වන්න පුලුවන් වුණා.

මම අපේ නාට්‍යයේ පාසලක ළමයෙකුගේ චරිතය රගපෑවා. මට කියන්න තිබ්බේ "අනුරාධපුරය" සහ "මේක එබුවම මෙයා උඩ පනිනවා" කියලා. මම එදා ගොඩක් සතුටු වුණා. අපේ නාට්‍යයේ නම "තාක්ෂණය කොයිබටද ?" යන්නයි.

ඕෂිනි පෙරේරා
රොක්ස්බර්ග් පාක් සිංහල භාෂා පාසල 5/6 පන්තිය